# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2029/50 - 2017 ජූලි මස 28 වැනි සිකුරාදා - 2017.07.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

අංක 997 දරන සුරාබදු නිවේදනය

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 2,12,22 සහ 25 වැනි වගන්ති සමග කියවිය යුතු 32 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර, වන මම පහත සඳහන් රීති ප්‍රකාශයට පත් කරමි.

ආනයනය කරනු ලබන සෑම පානීය නොවන ස්ප්‍රීතු තොග ලීටරයක් සඳහා රු. 25.00 ක සුරාබද්දක් මෙහි, පහත සඳහන් කර ඇති රීති වලට යටත්ව 2017.08.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අයකළ යුතු ය.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2017 ජූලි මස 28 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**රීති**

1. I. මෙහි I වන උපලේඛනයේ සඳහන් මධ්‍යසාර වර්ග සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) විධිවිධානවල කාර්යය සඳහා ''මත්පැන්'' ලෙස ප්‍රකාශ කරමි.

II. මෙම රීති ''පානීය නොවන ස්ප්‍රීතු සඳහා වූ රීති'' ලෙස හඳුන්වනු ලබන අතර 2017.08.01 දින සිට බලාත්මක විය යුතු ය. මෙම නිවේදනයේ විධිවිධාන පානීය ස්ප්‍රීතු, ස්වභාවය වෙනස් කරන ලද ස්ප්‍රීතු සහ උක් යුෂවලට අදාළව දැනට පවත්නාවූ නියෝගවලට කිසිදු ආකාරයකින් බල නොපෑ යුතු ය.

2. අර්ථ නිරූපන :-

I. යම්කිසි කාබනික රසායනික සංයෝගයක සූත්‍රය (IUPAC නාමකරණය අනුව) සැලකීමේදී එහි ඇල්ෆැටික කාබන් පරමාණුවකට ක්‍රියාකාරී කාණ්ඩය ලෙස හයිඩ්‍රොකසිල් කාණ්ඩයක් (-OH) සම්බන්ධ වී ඇති සංයෝග ඇල්කොහොල (මධ්‍යසාර) ලෙස හඳුන්වයි.

II. එතන් .I ඕල් (එතිල් ඇල්කොහොල්/එතනෝල්) පානීය ස්ප්‍රීතු ලෙසද මෙහි I වන උපලේඛනයේ සඳහන් අනෙකුත් සියළුම මධ්‍යසාර වර්ග ''පානීය නොවන ස්ප්‍රීතු'' ලෙසද හඳුන්වනු ලබයි.

පැහැදිලි කිරීම :-

| IUPAC නාමකරණය | රසායනික සූත්‍රය | සමායෝජිත වර්ගීකරණ සංකේත අංකය | ව්‍යවහාරික නම/නාමයන් |
|---|---|---|---|
| එතන් .I.ඕල් | $CH_3$-$CH_2$-OH | 2207.10 | එතනෝල්/එතිල් මධ්‍යසාරය/එතිල් ඇල්කොහොල් |

3. I. (මෙහි මින්මතු ''කොමසාරිස් ජනරාල්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් සුරාබදු ආඥාපනතේ විධිවිධාන යටතේ යම් තැනැත්තෙකුට තත් කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරී බලයක් යටතේ හැර, මෙහි I වන උපලේඛනයේ සඳහන් පානීය නොවන ස්ප්‍රීතු වර්ගයක් කිසිම තැනැත්තෙකු විසින් ආනයනය කිරීම, අපනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, සන්තකයේ තබා ගැනීම, ගබඩා කිරීම, විකිණීම, ප්‍රවාහනය කිරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය. වාර්ෂික බලපත්‍රයක් සඳහා සෑම ඉල්ලීමක්ම කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, මෙහි (II) වන උපලේඛනයේ දක්වා ඇති I ආකෘතිය අදාළ කර ගත යුතු ය.

II. පානීය නොවන ස්ප්‍රීතු ආනයනය කිරීම, අපනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, සන්තකයේ තබා ගැනීම, ගබඩා කිරීම, විකිණීම, ප්‍රවාහනය කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ලැබීමේ දී, කොමසාරිස් ජනරාල්වරයා විසින් සුරාබදු ආඥාපනතේ විධිවිධාන සහ එක් එක් බලපත්‍රයට අදාළව නිශ්චිතව සඳහන් කරන ලද මාර්ගෝපදේශ සහ කොන්දේසි වලට අනුව සහ ඒ සම්බන්ධයෙන් සෑහීමට පත් වන්නේ නම් IV වන උපලේඛනයේ දක්වා ඇති I,II,III සහ IV වන ආකෘතීන්ට අනුකූලව, අවස්ථානෝචිත පරිදි අදාළ බලපත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

III. කොමසාරිස් ජනරාල් නිකුත් කරනු ලබන ලද බලපත්‍රයක් ලිත් වර්ෂයක් සඳහා පමණක් වලංගු විය යුතු ය.

IV. මෙම රීති ප්‍රකාරව බලපත්‍රයක් ලබා ගැනීම සඳහා මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ බලපත්‍ර ගාස්තු හා බදු මුදල් ගෙවනු ලැබිය යුතු ය.

V. (I) වන උපවගන්තියේ නියමයන් ප්‍රකාරව කොමසාරිස් ජනරාල්වරයාගෙන් ලබා ගත් බලපත්‍රයක් යටතේ, කොමසාරිස් ජනරාල්වරයා විසින් කලින් කල නියම කළ ලැබිය යුතු යම් අනු ප්‍රමාණයන්ට අනුව අනුමත විපරිතකාරක එකතු කරන ලද්දේ නම් මිස, පානීය නොවන ස්ප්‍රීතු වර්ගයක් සන්තකයේ තබා ගැනීම, ගබඩා කිරීම, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය. බලපත්‍රධාරියා තම වියදමින් තත් කාලීන සුරාබදු නීති යටතේ අනුමත විපරිතකාරක එකතු කිරීම කරනු ලැබිය යුතු ය.

එසේ වුවද පානීය නොවන ස්ප්‍රීතු විද්‍යාත්මක හෝ පරීක්ෂණ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන අවස්ථාවලදී හෝ රජය විසින් අනුමත ආයතනයක් හෝ යම් රජයේ දෙපාර්තමේන්තුවක් විසින් එකී ස්ප්‍රීතු භාවිතා කිරීම සඳහා අවශ්‍ය වන අවස්ථාව දී, ඉහත කී විපරිතකාරක එකතු කිරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් අත්හරිනු ලැබිය හැක.

VI. 3 වන රීතිය යටතේ, අවස්ථානෝචිත පරිදි, බලපත්‍රයක් නිකුත් කරන ලැබ ඇති බලපත්‍රධාරියෙකු විසින් -

(අ) එවැනි යම් බලපත්‍රයක් අදාළ වන්නේ යම් පරිශ්‍රයකටද එම පරිශ්‍රය තුළ ගබඩා කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් අවසර දී ඇති පානීය නොවන ස්ප්‍රීතු වර්ගය හැර වෙනත් කිසිදු මධ්‍යසාර වර්ගයක් ගබඩා කර නොමැති බවටද, බලපත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් පානීය නොවන ස්ප්‍රීතු වර්ගයක් සඳහාද, එම ස්ප්‍රීතු වර්ගයට වෙනත් කිසිදු මධ්‍යසාර වර්ගයක්, එකතු කරනු නොලැබිය යුතු ය.

(ආ) පානීය නොවන ස්ප්‍රීතුවක් අඩංගු ඕනෑම ලේගරයක්, බැරලයක්, පීප්පයක්, භාජනයක් බෝතලයක් හෝ එවැනි යම් බහාලුමක V වන උපලේඛනයේ දක්වා ඇති පරිදි භාෂා තුනෙන්ම සුදු පසුබිමක රතු පාටින් මුද්‍රිත අනතුරු ඇඟවීමේ ලේබලයක් අලවා තිබිය යුතු ය.

VII. සෑම බලපත්‍රධාරියෙකුම තමා වෙත නිකුත් කර ඇති බලපත්‍රයේ නිශ්චිතව දැක්වෙන කොන්දේසි වලට සහ එම බලපත්‍ර වලට අදාළ සුරාබදු ආඥාපනතේ හෝ සුරාබදු නිවේදන වල නිශ්චිතව දක්වා ඇති වෙනත් මාර්ගෝපදේශ හෝ කොන්දේසි වලට යටත් විය යුතු ය.

VIII. මෙම රීති වල යම් විධිවිධාන උල්ලංඝනය කර ඇද්ද යන්න නිශ්චය කිරීමේ අරමුණින් හෝ විශ්ලේෂණය කිරීම සඳහා යම් පානීය නොවන ස්ප්‍රීතුවල නිදර්ශක ලබා ගැනීම සඳහා සුරාබදු පරීක්ෂක තනතුරට අඩු නොවූ තැනැත්තෙකුට බලය ඇත්තේ ය. එවැනි අවස්ථාවලදී කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබිය හැකි පරිදි වූ රජයේ රස පරීක්ෂකවරයාගෙන් හෝ වෙනත් පිළිගන්නා රසායනාගාරයකින් පරීක්ෂණ වාර්තාවක් ලබාගෙන ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

IX. ස්වකීය බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති පරිශ්‍රයේ පානීය නොවන ස්ප්‍රීතු ගබඩා කිරීම සුරාබදු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදු කළ යුතු අතර නිසි පරිදි අගුළු දැමිය හැකි පරිදි ගබඩාව සකස් කළ යුතු ය.

4. ආනයනය හෝ අපනයනය සඳහා වාර්ෂික බලපත්‍රයක් ලැබීමෙන් පසුව පානීය නොවන ස්ප්‍රීතු ආනයනය හෝ අපනයනය කරන සෑම අවස්ථාවකදීම II වන උපලේඛනයේ II ආකෘතිය ප්‍රකාරව අයදුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය. එම අයදුම් පත්‍රය පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා සෑහීවකට පත් වන්නේ නම් VI වන උපලේඛනයේ I ආකෘතිය අනුව වූ අනුමැතිය ආනයන අපනයන පාලක වෙත ලබා දිය යුතු ය. එම පානීය නොවන ස්ප්‍රීතු ශ්‍රී ලංකා රේගුවට ලැබීමෙන් පසුව මෙහි VI වන උපලේඛනයේ II ආකෘතියේ සඳහන් ලිපිය ශ්‍රී ලංකා රේගුවේ බලයලත් නිලධාරියෙකු විසින් සහතික කර එම ස්ප්‍රීතු නිදහස් කර ගැනීමට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඉන්පසු නියමිත සුරාබද්ද ගෙවීමෙන් පසුව කොමසාරිස් ජනරාල්වරයා විසින් එකී ස්ප්‍රීතු ප්‍රවාහනය සඳහා වූ VI වන උපලේඛනයේ III ආකෘතියේ සඳහන් ප්‍රවාහන අවසර පත්‍රයක් නිකුත් කළ යුතු ය.

5. මෙම නිවේදනය යටතේ ඇති වගන්ති හා කොන්දේසි සහ මෙම නිවේදනය යටතේ නිකුත් කර ඇති බලපත්‍ර හා අවසර පත්‍රවල ඇති කොන්දේසි කඩ කළ හොත් සුරාබදු ආඥාපනතේ 56 යටතේ කටයුතු කළ යුතු ය.

6. 1984 අප්‍රේල් මස 5 වැනි දින අංක 291/ii දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 721 දරන සුරාබදු නිවේදනය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

*I වන උපලේඛනය*

| *IUPAC නාමකරණය* | *රසායනික සූත්‍රය* | *සමායෝජිත වර්ගීකරණ සංකේත අංකය* | *ව්‍යවහාරික නම/නාමයන්* |
|---|---|---|---|
| මෙතන් .1. ඕල් | $CH_3$- OH | 2905.11 | මෙතනෝල්/මීතයිල් ඇල්කොහොල් |
| ප්‍රොපන් .1. ඕල් | $CH_3$- $CH_2$ - $CH_2$ - OH | 2905.12 | ප්‍රොපයිල් ඇල්කොහොල්/ ප්‍රොපයිල් මධ්‍යසාරය |
| ප්‍රොපන් .2. ඕල් | $CH_3$- CH - $CH_3$<br>\|<br>OH | 2905.12 | 2. ප්‍රොපයිල් මධ්‍යසාරය/අයිසො ප්‍රොපයිල් මධ්‍යසාරය |
| බියුටන් .1. ඕල් | $CH_3$- $CH_2$-$CH_2$-$CH_2$-OH | 2905.13 | n-බියුටයිල් ඇල්කොහොල් /n බියුටයිල් මධ්‍යසාරය |
| 2.මෙතිල්. ප්‍රොපන් .1. ඕල් | $CH_3$- $CH_1$-$CH_2$- OH<br>$CH_3$ | 2905.14 | අයිසො බියුටනෝල්/අයිසො බියුටයිල් මධ්‍යසාරය |
| බියුටන් .2. ඕල් | $CH_3$- CH - $CH_2$ - OH<br>$CH_3$ | 2905.14 | ද්විතීය බියුටයිල් මධ්‍යසාරය |
| 2. මෙතිල් ප්‍රොපන් .2. ඕල් | $CH_3$<br>\|<br>$CH_3$ - $C_1$ - OH<br>\|<br>$CH_3$ | 2905.14 | තෘතියීය බියුටයිල් මධ්‍යසාරය |

*II වන උපලේඛනය*

*I ආකෘතිය*

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව**

(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත

**පානීය නොවන ස්ප්‍රීතු සඳහා වූ සියළුම වාර්ෂික බලපත්‍ර ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය**

(1 සිට 7 දක්වා වූ අයිතමයන් ඉල්ලුම්කරු සම්පූර්ණ කළ යුතු ය)

1. ඉල්ලුම්කරුගේ/ඉල්ලුම්කරුවන්ගේ/ඉල්ලුම්කරන ආයතනයේ නම සහ ලිපිනය ፡

   ..........................................................................................................................

2. ඉල්ලුම්කරුගේ/ඉල්ලුම්කරුවන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය/අංක ፡-

   ..........................................................................................................

3. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය ፡- ....................................................................

4. බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය (TIN) ፡- ....................................................

5. ස්ප්‍රීතු ගබඩා කිරීමට යෝජිත පරිශ්‍රය පිළිබඳ තොරතුරු ፡-
   - i. තැපැල් ලිපිනය
   - ii. පළාත් සභාව
   - iii. පරිපාලන දිස්ත්‍රික්කය
   - iv. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
   - v. පළාත් පාලන ආයතනය
   - vi. පොලිස් වසම
   - vii. සුරාබදු බල ප්‍රදේශය

6. ඉල්ලුම්කරු/ඉල්ලුම්කරුවන් විසින් පානීය නොවන ස්ප්‍රීතු ආනයනය/අපනයනය/නිෂ්පාදනය/ගබඩා කිරීම/විකිණීම සඳහා පහත සඳහන් තොරතුරු සැපයිය යුතු ය.
   - i. ස්ප්‍රීතු වර්ගයේ නම ፡- ..........................................
     - a. IUPAC නාමකරණය ፡ .............................................
     - b. රසායනික සූත්‍රය ፡ ..............................................
     - c. සමායෝජිත වර්ගීකරණ සංකේත අංකය (HS Code) ፡ ..............................................
   - ii. බලපත්‍රය ලබා ගැනීමේ අරමුණ ፡-
   - iii. පූර්ව වර්ෂයේ දී ආනයනය/අපනයනය/නිෂ්පාදනය/ගබඩා කිරීම/විකිණීම කළ ස්ප්‍රීතු පිළිබඳ විස්තර (සවිස්තරාත්මකව ඇමිණිය යුතු ය) ፡-
   - iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදකරුවෙකු නොවන බවට දිවුරුම් ප්‍රකාශයක් (මේ සමග ඇමිණිය යුතු ය) ፡-
   - v. පරිසර වාර්තාව (නිෂ්පාදනය, ආනයනය,) ፡-
   - vi. තොග ගබඩා කිරීමට යෝජිත ස්ථානයේ මායිම් ፡

     උතුර ፡-

     නැගෙනහිර ፡-

     දකුණ ፡-

     බටහිර ፡-

7. I. තොග ලබාගන්නා ආකාරය (ආනයනය/තොග වෙළඳාම්කරුවෙකු මගින්) ፡-

   II. අදාළ පරිදි ඉහත I හි සඳහන් ආයතනයේ නම සහ ලිපිනය ፡-

දිනය ፡- ........................................ ..............................................

ඉල්ලුම්කරුගේ අත්සන

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

8. ස්ථානභාර නිලධාරීගේ නිර්දේශය :-

.......................................................................................

දිනය :- ................................................ ......................................................

ස්ථානභාර නිලධාරීගේ අත්සන

9. සුරාබදු අධිකාරිගේ නිර්දේශය :-

.......................................................................................................................................................................................

දිනය :- .................................................... ......................................................

සුරාබදු අධිකාරිගේ අත්සන

10. සහකාර සුරාබදු කොමසාරිස්ගේ නිර්දේශය :-

.......................................................................................................................................................................................

දිනය :- ............................................. ......................................................

සහකාර සුරාබදු කොමසාරිස්ගේ අත්සන

11. නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්ගේ නිර්දේශය :-

.......................................................................................................................................................................................

දිනය :- ............................................ ........................................................

නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්ගේ අත්සන

12. සුරාබදු කොමසාරිස්ගේ නිර්දේශය :-

.......................................................................................................................................................................................

දිනය :- ............................................... .....................................................

සුරාබදු කොමසාරිස්ගේ අත්සන

*II වන උපලේඛනය*

II ආකෘතිය

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව**

**(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත**

**පානීය නොවන ස්ප්‍රීතු ආනයනය/අපනයනය සඳහා අනුමැතිය ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය**

(1 සිට 6 දක්වා වූ අයිතමයන් ඉල්ලුම්කරු සම්පූර්ණ කළ යුතු ය)

1. ඉල්ලුම්කරුගේ/ඉල්ලුම්කරුවන්ගේ/ඉල්ලුම්කරන ආයතනයේ නම සහ ලිපිනය ඃ

   ..........................................................................................................................

2. ඉල්ලුම්කරුගේ/ඉල්ලුම්කරුවන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය/අංක ඃ-

   ..........................................................................................................

3. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය ඃ- ....................................................................

4. බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය (TIN) ඃ- ..................................................

5. ස්ප්‍රීතු ගබඩා කිරීමට අනුමත පරිශ්‍රයේ ඃ-
   i. තැපැල් ලිපිනය ඃ- .......................................
   ii. සුරාබදු බල ප්‍රදේශය ඃ- ..................................

6. ඉල්ලුම්කරු/ඉල්ලුම්කරුවන් විසින් පානීය නොවන ස්ප්‍රීතු ආනයනය/අපනයනය කිරීමට අදාළව පහත සඳහන් තොරතුරු සැපයිය යුතු ය.
   i. ආනයන/අපනයනය කරන ස්ප්‍රීතු වර්ගයේ නම ඃ- ..........................................
      a. IUPAC නාමකරණය ඃ .............................................
      b. රසායනික සූත්‍රය ඃ .............................................
      c. සමායෝජිත වර්ගීකරණ සංකේත අංකය (HS Code) ඃ .............................................
      d. මධ්‍යසාර ප්‍රමාණයක හා ප්‍රතිශතය ඃ .............................................
   ii. ආනයනය/අපනයනය කරනු ලබන රට (නාම මාත්‍ර ඉන්වොයිසිය ඇමිණිය යුතු ය) ඃ-
   iii. අදාළ වර්ෂය තුළ ආනයනය/අපනයනය කළ ස්ප්‍රීතු වර්ගයන් සහ ප්‍රමාණයන් (විස්තර ඇමිණිය යුතු ය) ඃ-
   iv. ආනයනය/අපනයනය කිරීම අපේක්ෂිත දිනය ඃ-

7. සෑම ඉල්ලුම්පත්‍රයක්ම අදාළ සුරාබදු ස්ථානාධිපති, සුරාබදු අධිකාරි සහ සහකාර සුරාබදු කොමසාරිස්ගේ නිර්දේශ සමග ඉදිරිපත් කළ යුතු ය.

දිනය ඃ- ........................................ ..............................................

ඉල්ලුම්කරුගේ අත්සන

*III වන උපලේඛනය*

අදාළ බලපත්‍ර ගාස්තුව

| | *I වන තීරය*<br>*බලපත්‍රයේ ස්වභාවය* | *II වන තීරය*<br>*බලපත්‍ර ගාස්තුව (රු)* |
|---|---|---|
| 1. | පානීය නොවන ස්ප්‍රීතු නිෂ්පාදනය ගබඩා කිරීම හා තොග වශයෙන් අලෙවිය | 50,000.00 |
| 2. | පානීය නොවන ස්ප්‍රීතු ආනයනය, ගබඩා කිරීම හා තොග වශයෙන් අලෙවිය සඳහා වූ බලපත්‍රය | 50,000.00 |
| 3. | අපනයනය සඳහා වූ බලපත්‍රය | 10,000.00 |
| 4. | පානීය නොවන ස්ප්‍රීතු ගබඩා කිරීමේ සහ සිල්ලරට විකිණීමේ බලපත්‍රය | 5,000.00 |

*IV වන උපලේඛනය*

I වන ආකෘතිය

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

**(52 වන අධිකාරිය වූ) සුරාබදු ආඥාපනත**

පානීය නොවන ස්ප්‍රීතු ආනයනය/අපනයනය සඳහා වූ බලපත්‍රය
(සුරාබදු ආඥාපනතේ 12 වන වගන්තිය)

බලපත්‍ර ගාස්තුව ............................................................
මෙම බලපත්‍රය 20 ...................... සිට 20 ........................................ දක්වා වලංගු වේ.

1. ආනයනකරුගේ/අපනයනකරුගේ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය ඃ-
........................................................................................................................................
........................................................................................................................................
2. ව්‍යාපාර ලියාපදිංචි අංකය ඃ-
........................................................................................................................................
3. ආනයන/අපනයනය කරනු ලබන රටවල් ඃ-
........................................................................................................................................
........................................................................................................................................
4. මෙම බලපත්‍රය යටතේ ආනයනය/අපනයනය කරනු ලබන ද්‍රව්‍ය පිළිබඳ විස්තර ඃ-

| ආනයනය/අපනයනය කරනු ලබන ස්ප්‍රීතුවේ නම | විද්‍යාත්මක නාමය | සමායෝජිත වර්ගීකරණ සංකේත අංකය (HS Code) | ප්‍රමාණය (ලීටර් වලින්) (වාර්ෂිකව) |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

5. (i) (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉහත (4) වන අයිතමයේ විස්තර කර ඇති පානීය නොවන ස්ප්‍රීතු ආනයනය/අපනයනය සඳහා බලය ලබා දෙමි.

(ii) පසු පිටේ සඳහන් කොන්දේසි වලට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලැබේ.

දිනය ඃ............................ ..............................................................
සුරාබදු කොමසාරිස් (ආදායම්)

1. මෙම බලපත්‍රය නිකුත් කර ඇත්තේ යම් පරිශ්‍රයක් සඳහාද එම පරිශ්‍රය තුළ මෙම බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කාර්ය සඳහා පමණක් වලංගු වේ.

2. බලපත්‍ර පැවරිය නොහැකි අතර, බලපත්‍රයට යටතේ ඇති යම් සම්බන්ධතාවයක් බලපත්‍රදීමේ අධිකාරියේ අනුමැතිය නොමැතිව විකිණීම හෝ බදු දීම නොකළ යුතු ය.

3. බලපත්‍රධාරියා විසින්, බලපත්‍රයට අදාළ සියලු සුරාබදු රීති සහ නියෝග සමග මෙන්ම එකී බලපත්‍රයට අදාළව කලින් කලට සුරාබදු ආඥාපන යටතේ පනවනු ලැබිය හැකි වෙනත් යම් අතිරේක රීති සහ නියෝග වලට අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටියි.

4. ශ්‍රී ලංකාවට ආනයනය හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම සඳහා පමණක් බලපත්‍රය දීර්ඝ කරනු ලැබිය යුතු ය.

5. ගිණුම්ගත කිරීම :- පානීය නොවන ස්ප්‍රීතු ආනයනය/අපනයනය කරන සෑම තැනැත්තෙකු විසින් කොමසාරිස් ජනරාල් සඳහන් කරන ලද යම් ආකෘතියකින් නිසි ගිණුම් පොත් පවත්වාගෙන යා යුතු ය. මෙම රීතිය යටතේ වූ නිවේදනයක් බලපත්‍රධාරියා ස්වකීය ව්‍යාපාර කටයුතු කරනු ලබන පරිශ්‍රයෙහි තත්කාලයෙහි ප්‍රධානියා වන තැනැත්තා වෙත තැපෑලෙන් යවනු ලැබ ඇත්නම් හෝ භාර දී ඇත්නම් හෝ දොරෙහි ගේට්ටුවේ අලවා ඇත්නම් එම නිවේදනය බලපත්‍රධාරී වෙත යථා පරිදි භාර දී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

6. සුරාබදු ආඥාපනත යටතේ යම් බලයලත් නිලධාරියෙකු විසින් යම් බලපත්‍රලත් පරිශ්‍රයක් තුළට ඇතුලු වී එම පරිශ්‍රය අධීක්ෂණය කිරීම හෝ සුරාබදු ආඥාපනත යටතේ හෝ තත්කාලයේ බලපවත්නා වෙනත් යම් නීතියක් යටතේ නිදර්ශක ලබා ගැනීම, තහනමට ගැනීම සඳහා හෝ සාක්ෂියක් වශයෙන් ලබා ගැනීම සඳහා සාධාරණ ලෙස විශ්වාස කළ හැකි යම් සුරාබදු ද්‍රව්‍ය, වෙනත් ද්‍රව්‍ය, බිල් පත්‍ර, ඉන්වොයිස් සහ පොත් සහ ලේඛන තහනමට ගෙන රඳවා තබා ගැනීම සඳහා බලපත්‍රලාභියා විසින් සියලු පහසුකම් සහ සහාය ලබා දිය යුතු ය.

7. සුරාබදු කොන්දේසිවලට එකඟව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, කොමසාරිස් ජනරාල් විසින් බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකිය. බලපත්‍රයට කරනු ලබන වෙනස්කමක් නිසි බලධාරී අධිකාරිය විසින් පමණක් කරනු ලැබිය හැකි ය.

8. ශ්‍රී ලංකාවට පානීය නොවන ස්ප්‍රීතු ආනයනය කළ පසු ඒ සඳහා නියමිත සුරාබද්ද ගෙවීම සඳහා බලපත්‍රධාරියා කටයුතු කළ යුතු ය.

9. පානීය නොවන ස්ප්‍රීතු ආනයනය කළ පසුව හෝ අපනයනය කිරීමට ප්‍රවාහනය කිරීමේදී සුරාබදු නිලධාරින් නිකුත් කරන අවසර පත්‍රයක් පිට මිස නොකළ යුතු ය.

10. පානීය නොවන ස්ප්‍රීතු ආනයනය හෝ අපනයනය කරන සෑම අවස්ථාවකදීම II වන උපලේඛනයේ II ආකෘතිය අනුව ඉල්ලුම් පත්‍රයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු ය.

ප්‍රතිරූපී ගිවිසුම :-

ඉහත සඳහන් බලපත්‍රලාභියා වන ............................................................................... මා විසින් බලපත්‍රයේ අන්තර්ගත නියමයන් සහ කොන්දේසි සැබෑ වශයෙන්ම පිළිපදින බවට සහ ඉටු කරනු ලබන බවට බලපත්‍ර අධිකාරිය සමග මෙයින් එකඟ වෙමි.

............................................
බලපත්‍රලාභියාගේ අත්සන

සාක්ෂිකරුවන් :-

20 ................. මස ...................... දින දී ය.

## *IV වන උපලේඛනය*

### II වන ආකෘතිය

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව**

(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත

පානීය නොවන ස්ප්‍රීතු නිෂ්පාදන ගබඩා කිරීම සහ තොග වශයෙන් විකිණීම සඳහා බලයලත් වෙළඳුන් සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රය (18 වන වගන්තිය).

බලපත්‍ර ගාස්තුව ......................................
මෙම බලපත්‍රය 20 ............................. සිට 20 .................................. දක්වා වලංගු වේ.

| | |
|---|---|
| දිස්ත්‍රික්කය :- ................................................<br>නිකුත් කළ දිනය :- .....................................<br>බලපත්‍ර ගාස්තුව :- ...................................... | ලියාපදිංචි අංකය :- .....................................<br>අවසන් දිනය :- ...........................................<br>මුද්දර ගාස්තුව :- ......................................... |
| 1. බලපත්‍රලාභියාගේ නම, ලිපිනය සහ ජා.හැ.පත් අංකය :-<br>..........................................................................................<br>..........................................................................................<br>..........................................................................................<br><br>2. සමාගමක් නම් සමාගම් ලියාපදිංචි අංකය :-<br>.......................................................................................... | 3. බලපත්‍රලත් පරිශ්‍රයේ නම සහ ලිපිනය :-<br>................................................................<br>................................................................<br>................................................................ |
| 4. පරිශ්‍රය පිළිබඳ විස්තර (මායිම් සඳහන් කළ යුතු ය) :-<br>..........................................................................................<br>..........................................................................................<br>..................................... | |
| 5. සුරාබදු ආඥාපනතේ විධිවිධාන යටතේ නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම සහ තොග වශයෙන් විකිණීම සඳහා අපේක්ෂා කරනු ලබන පානීය නොවන ස්ප්‍රීතුවේ නම සහ විස්තර :- | |
| 6. (i) (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉහත (4) වන අයිතමයේ විස්තර කර ඇති පරිශ්‍රය මෙයින් අනුමත කරනු ලබන අතර, (5) වන අයිතමයේ විස්තර කර ඇති පානීය නොවන ස්ප්‍රීතු නිෂ්පාදනය, ගබඩා කිරීම සහ තොග වශයෙන් විකිණීම සඳහා බලය ලබා දෙමි.<br><br>(ii) පසු පිටේ සඳහන් කොන්දේසිවලට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලැබේ.<br><br>දිනය ............................................     .................................................. සුරාබදු කොමසාරිස් (ආදායම්) | |

1. මෙම බලපත්‍රය නිකුත් කර ඇත්තේ යම් පරිශ්‍රයක් සඳහාද එම පරිශ්‍රය තුළ මෙම බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කාර්ය සඳහා පමණක් වලංගු වේ.

2. බලපත්‍ර පැවරිය නොහැකි අතර, බලපත්‍රය යටතේ ඇති යම් සම්බන්ධතාවයක් බලපත්‍රදීමේ අධිකාරියේ අනුමැතිය නොමැතිව විකිණීම හෝ බදු දීම නොකළ යුතු ය.

3. බලපත්‍රධාරියා විසින්, බලපත්‍රයට අදාළ සියලු සුරාබදු රීති සහ නියෝග සමග මෙන්ම එකී බලපත්‍රයට අදාළව කලින් කලට සුරාබදු ආඥාපනත යටතේ පනවනු ලැබිය හැකි වෙනත් යම් අතිරේක රීති සහ නියෝග වලට අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටියි.

4. ශ්‍රී ලංකාව තුළ පානීය නොවන ස්ප්‍රීතු නිෂ්පාදනය, නිෂ්පාදනය කළ පානීය නොවන ස්ප්‍රීතු ගබඩා කිරීම සහ තොග වශයෙන් විකිණීම සඳහා පමණක් බලපත්‍රය දීර්ඝ කරනු ලැබිය යුතු ය.

5. ගිණුම්ගත කිරීම :- පානීය නොවන ස්ප්‍රීතු නිෂ්පාදනය කරන සෑම නිෂ්පාදකයෙකුටම ගබඩා කරුවෙකුටම තොග වෙළෙන්දෙකුම කොමසාරිස් ජනරාල් විසින් සඳහන් කරන ලද යම් ආකෘතියකින් නිසි ගිණුම් පොත් පවත්වාගෙන යා යුතු ය. මෙම රීතිය යටතේ වූ නිවේදනයක් බලපත්‍රධාරියා ස්වකීය ව්‍යාපාර කටයුතු කරනු ලබන පරිශ්‍රයෙහි තත්කාලයෙහි ප්‍රධානියා වන තැනැත්තා වෙත තැපැලෙන් යවනු ලැබ ඇත්නම් හෝ භාර දී ඇත්නම් හෝ දොරෙහි ගේට්ටුවේ අලවා ඇත්නම් එම නිවේදනය බලපත්‍රධාරී වෙත යථා පරිදි භාර දී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

6. සුරාබදු ආඥාපනත යටතේ යම් බලයලත් නිලධාරියෙකු විසින් යම් බලපත්‍රලත් පරිශ්‍රයක් තුළට ඇතුලු වී එම පරිශ්‍රය අධීක්ෂණය කිරීම හෝ සුරාබදු ආඥාපනත යටතේ හෝ තත්කාලයේ බලපවත්නා වෙනත් යම් නීතියක් යටතේ නිදර්ශක ලබා ගැනීම, තහනමට ගැනීම සඳහා හෝ සාක්ෂියක් වශයෙන් ලබා ගැනීම සඳහා සාධාරණ ලෙස විශ්වාස කළ හැකි යම් සුරාබදු ද්‍රව්‍ය, වෙනත් ද්‍රව්‍ය, බිල් පත්‍ර, ඉන්වොයිස් සහ පොත් සහ ලේඛන තහනමට ගෙන රඳවා තබා ගැනීම සඳහා බලපත්‍රලාභියා විසින් සියලු පහසුකම් සහ සහාය ලබා දිය යුතු ය.

7. සුරාබදු කොන්දේසිවලට එකඟව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, කොමසාරිස් ජනරාල් විසින් බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකිය. බලපත්‍රයට කරනු ලබන වෙනස්කමක් නිසි බලධාරී අධිකාරිය විසින් පමණක් කරනු ලැබිය හැකි ය.

8. ප්‍රදේශයේ සුරාබදු අධිකාරී විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ මිස පානීය නොවන ස්ප්‍රීතු ප්‍රවාහනය නොකළ යුතු ය.

ප්‍රතිරූපී ගිවිසුම :-

ඉහත සඳහන් බලපත්‍රලාභියා වන ................................................................................. මා විසින් බලපත්‍රයේ අන්තර්ගත නියමයන් සහ කොන්දේසි සැබෑ වශයෙන්ම පිළිපදින බවට සහ ඉටු කරනු ලබන බවට බලපත්‍ර අධිකාරිය සමග මෙයින් එකඟ වෙමි.

.............................................
බලපත්‍රලාභියාගේ අත්සන

සාක්ෂිකරුවන් :-

20 ................. මස ...................... දින දී ය.

*IV වන උපලේඛනය*

**III වන ආකෘතිය**

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

පානීය නොවන ස්ප්‍රීතු (තොග/සිල්ලර) විකිණීම සඳහා වූ බලපත්‍රය (18 වන වගන්තිය)

බලපත්‍ර ගාස්තුව : ..............................................

මෙම බලපත්‍රය 20 ........................................... සිට 20 .............................................. දක්වා වලංගු වේ.

| | |
|---|---|
| දිස්ත්‍රික්කය :- ..............................................<br>නිකුත් කළ දිනය :- ....................................<br>බලපත්‍ර ගාස්තුව :- ...................................... | ලියාපදිංචි අංකය :- ....................................<br>බලපත්‍රයේ වලංගු කාලය :- .........................<br>මුද්දර ගාස්තුව :- .......................................... |
| (1) බලපත්‍ර වර්ගය (තොග/සිල්ලර) :- ................................<br>විවෘත හා වසන කරන වේලාවන් :- ............................ | |
| (2) බලපත්‍රධාරියාගේ නම, ලිපිනය සහ ජා. හැ. පත් අංකය :-<br>........................................................................................<br>........................................................................................<br>........................................................................................ | (3) බලපත්‍රලත් පරිශ්‍රයේ නම සහ ලිපිනය :-<br>...............................................................<br>...............................................................<br>............................................................... |
| (4) පරිශ්‍රය පිළිබඳ විස්තර (මායිම් සඳහන් කළ යුතු ය) :-<br>........................................................................................................................................<br>........................................................................................................................................ | |
| (5) සුරාබදු ආඥාපනතේ 18 වන වගන්තියේ විධිවිධාන යටතේ විකිණීම සඳහා වූ බලයලත් පානීය නොවන ස්ප්‍රීතුවේ නම සහ විස්තර :- | |
| (6) (i) (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 18 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉහත (4) වන අයිතමයේ විස්තර කර ඇති පරිශ්‍රය මෙයින් අනුමත කරනු ලබන අතර, (5) වන අයිතමයේ විස්තර කර ඇති පානීය නොවන ස්ප්‍රීතු තොග සහ සිල්ලර වශයෙන් විකිණීම සඳහා බලය ලබා දෙමි. | |

(ii) මෙම බලපත්‍රය පසු පිටෙහි සඳහන් කරන ලද කොන්දේසි වලට යටත්ව නිකුත් කරනු ලැබේ.

......................................................

දිනය ........................................ බලපත්‍ර දීමේ අධිකාරිය

1. පානීය නොවන ස්ප්‍රීතු ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද්දේ වුව ද, ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද්දේ වුව ද, එමෙන්ම ඒ මත නියමිත තීරු බදු ගාස්තු ගෙවා ඇත්තේ වුව ද, එම පානීය නොවන ස්ප්‍රීතු තොග/සිල්ලරට විකිණීම සඳහා පමණක් මෙම බලපත්‍රය දීර්ඝ කරනු ලැබිය යුතු ය.

2. කොමසාරිස් ජනරාල්වරයාගේ අවසරය ඇතිව මිස, මෙම බලපත්‍රයේ අධිකාරී බලය යටතේ කරගෙන යනු ලබන ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් වූ කිසිම සම්බන්ධතාවයක් බලපත්‍රලාභියා විසින් විකිණීම, මාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම නොකළ යුතු ය.

3. ගිණුම්ගත කිරීම :- පානීය නොවන ස්ප්‍රීතු සෑම තොග හා සිල්ලර වෙළෙන්දෙකුම තැනැත්තෙකු විසින් කොමසාරිස් ජනරාල් විසින් සඳහන් කරන ලද යම් ආකෘතියකින් නිසි ගිණුම් පොත් පවත්වාගෙන යා යුතු ය. මෙම රීතිය යටතේ වූ නිවේදනයක් බලපත්‍රධාරියා ස්වකීය ව්‍යාපාර කටයුතු කරනු ලබන පරිශ්‍රයෙහි තත්කාලයෙහි ප්‍රධානියා වන තැනැත්තා වෙත තැපෑලෙන් යවනු ලැබ ඇත්නම් හෝ භාර දී ඇත්නම් හෝ දොරෙහි ගේට්ටුවේ අලවා ඇත්නම් එම නිවේදනය බලපත්‍රධාරී වත යථා පරිදි භාර දී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

4. ප්‍රදේශයේ සුරාබදු අධිකාරී විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ මිස බලපත්‍රලාභී පරිශ්‍රයක් තුළට පානීය නොවන ස්ප්‍රීතු කිසිවක් ප්‍රවාහනය නොකළ යුතු ය.

5. බලපත්‍රයක් රහිත යම් තනි පුද්ගලයකුට විකුණන ලබන අවස්ථාවක දී, එම ස්ප්‍රීතු ප්‍රමාණය ලීටර් 4.5 නොඉක්මවිය යුතු ය. එම ප්‍රමාණය සඳහා ප්‍රවාහන අවසර පත්‍ර අවශ්‍ය නොවේ.

6. I වන උපලේඛනය නිශ්චිතව දැක්වෙන පානීය නොවන ස්ප්‍රීතු වර්ගයක් සිල්ලර වශයෙන් විකිණීම සඳහා බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු විසින් ලීටර 600 ක් ඉක්මවනු ලබන ස්ප්‍රීතු ප්‍රමාණයක් තම සන්තකයේ තබා ගැනීම නොකළ යුතු ය.

ප්‍රතිරූපී ගිවිසුම :-

ඉහත සඳහන් බලපත්‍රලාභියා වන ................................................................................. මා විසින් බලපත්‍රයේ අන්තර්ගත නියමයන් සහ කොන්දේසි සැබෑ වශයෙන්ම පිළිපදින බවට සහ ඉටු කරනු ලබන බවට බලපත්‍ර අධිකාරිය සමග මෙයින් එකඟ වෙමි.

.............................................. ..............................................

සාක්ෂිකරුවන් :- බලපත්‍රලාභියාගේ අත්සන

20 .................. මස ....................... දින දී ය.

*IV වන උපලේඛනය*

IV වන ආකෘතිය

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත

පානීය නොවන ස්ප්‍රීතු ප්‍රවාහනය කිරීම සඳහා අවසර පත්‍රය

නිකුත් කළ ආයතනය :- ..............................................................................

නිකුත් කළ දිනය සහ වේලාව :- .................................................................

බලපත්‍රයේ වලංගුභාවය :- ....................... දින පෙ.ව/ප.ව .......................... සිට .................... දක්වා දිනය :- .......................

| | |
|---|---|
| (1) බලපත්‍රයේ ප්‍රවාහනකරුගේ නම සහ ලිපිනය | |
| (2) ස්ප්‍රීතු ලබා ගැනීම සඳහා බලයලත් බලපත්‍රලාභියාගේ නම සහ ලිපිනය | |
| (3) ස්ප්‍රීතු ප්‍රවාහනය කරනු ලබන පරිශ්‍රයේ ලිපිනය | |
| (4) නිකුත් කළ ස්ප්‍රීතු වර්ගය සහ මුලු ස්ප්‍රීතු ප්‍රමාණය (කි. ග්‍රෑම්/ලීටර්) | |
| (5) ස්ප්‍රීතු නිකුත් කළ බහාලුම් සංඛ්‍යාව (ධාරිතාව සහ තොරතුරු සපයන්න) | |
| (6) වාහනයේ අංකය | |
| (7) ප්‍රවාහනය සඳහා යොදා ගන්නා මාර්ගය | |

පහත දැක්වෙන කොන්දේසි සහ පසු පිටේ නිශ්චිතව සඳහන් කරන ලද කොන්දේසි වලට යටත්ව, අනුමත කරන ලදුව (7) වන තීරයේ දක්වා ඇති මාර්ගයේ ............................................... දින (දිනය) පෙ.ව. ................................ ත් ප.ව. .............................. ත් අතර කාලය තුළ .......................... බලයලත් පරිශ්‍රයන්ට (4) වන තීරයේ සඳහන් කරන ලද ස්වභාවය වෙනස් කරන ලද ස්ප්‍රීතු ලීටර් ...................... ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීමට ................................ (ප්‍රවාහනකරුගේ නම) බලය දෙනු ලැබේ.

1. අවසරපත්‍රය, එම අවසර පත්‍රයේ බලය දුන් වේලාව සහ දිනය තුළදී පමණක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.
2. අවසරපත්‍රයෙන් ආවරණය කිරීමට අරමුණු කරන පානීය නොවන ස්ප්‍රීතු ප්‍රවාහනයේදී අවසර පත්‍රයේ මුල් පිටපත සෑම විටම රැගෙන යා යුතු අතර සුරාබදු නිලධාරියාට එය පෙන්විය යුතු ය.
3. අවසර පත්‍රය පවරනු ලැබිය නොහැකිය.
4. මෙහි සඳහන් කර ඇති ගමන් මාර්ගයේම පමණක් ප්‍රවාහනය කළ යුතු ය.
5. ප්‍රවාහනයේ දී රථය අනතුරකට හෝ ආපදාවකට ලක් වුව හොත් බලපත්‍ර නිකුත් කිරීමේ අධිකාරිය වෙත හෝ අදාළ සුරාබදු බල ප්‍රදේශයේ සුරාබදු ස්ථානාධිපති වෙත දැනුම් දී එම උපදෙස් අනුව කටයුතු කළ යුතු ය.
6. මෙහි සඳහන් කිසිදු තොරතුරකට පටහැනි වන අයුරින් භාවිතා නොකළ යුතු ය.
7. මෙම අවසර පත්‍රය භාවිතා කළ පසු ස්ප්‍රීතු රැගෙන යන ස්ථානයේ ගොනු කර තබා ගත යුතු ය.

දිනය :- ................................................ .....................................................

සුරාබදු අධිකාරී

*V වන උපලේඛනය*

ස්ප්‍රීතු වර්ගයේ නම :- සිංහල
දෙමළ
ඉංග්‍රීසි




(සුදු පසුබිමේ රතු පාටින් මුද්‍රණය විය යුතු ය.)

*VI වන උපලේඛනය*

I වන ආකෘතිය

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

අයදුම්පත්‍රයේ අංකය :-

ආනයන හා අපනයන පාලක,
ආනයන හා අපනයන පාලක දෙපාර්තමේන්තුව,
කොළඹ.

පානීය නොවන ස්ප්‍රීතු ආනයනය/අපනයනය කිරීම.

.................................................................................................................................................. (ලිපිනය) පදිංචි ..................... ....................................................... (සම්පූර්ණ නම) යන අයට මෙහි පහත සඳහන් පානීය නොවන ස්ප්‍රීතු ප්‍රමාණය ආනයනය/අපනයනය කිරීම සම්බන්ධයෙන් අප දෙපාර්තමේන්තුවේ විරුද්ධත්වයක් නොමැති බවට ප්‍රකාශ කරමි.

නාමමාත්‍රික ඉන්වොයිස් අංකය හා දිනය -

පානීය නොවන ස්ප්‍රීතු වර්ගය -

තොග ලීටර් ප්‍රමාණය -

වලංගු කාලය -

දිනය :-

............................................................
සුරාබදු කොමසාරිස්

*VI වන උපලේඛනය*

II වන ආකෘතිය

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

සුරාබදු කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රේගු සහතිකය

ආනයන/අපනයන පාලකගේ අංක .................................................. දරන බලපත්‍රය යටතේ .................................................. පදිංචි ..................................................................... (සම්පූර්ණ නම) විසින් පහත සඳහන් පානීය නොවන ස්ප්‍රීතු ආනයනය කර ඇති බව ප්‍රකාශ කරමි.

බහාලුම් අංකය :-

පානීය නොවන ස්ප්‍රීතු වර්ගය :-

ප්‍රමාණය (තොග ලීටර්/කිලෝ ග්‍රෑම්) :-

සමායෝජිත වර්ගීරණ අංකය (H. S. Code) :-

වෙනත් කරුණු :-

දිනය :- ............................................................

බලයලත් රේගු නිලධාරී

*VI වන උපලේඛනය*

III වන ආකෘතිය

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

ආනයනය කරන ලද පානීය නොවන ස්ප්‍රීතු ප්‍රවාහනය සඳහා අවසර පත්‍රය

1. බලපත්‍ර හිමියාගේ නම :- ..................................................................................................................
   ලිපිනය :- ..................................................................................................................
   දුරකථන අංකය :- ..................................................................................................................
   විද්‍යුත් තැපැල :- ..................................................................................................................
2. රියදුරුගේ නම :- ..................................................................................................................
   ජාතික හැඳුනුම්පත් අංකය :- ..................................................................................................................
3. ස්ප්‍රීතු රැගෙන යන ස්ථානයේ නම සහ ලිපිනය :- ..................................................................................................................
4. පානීය නොවන ස්ප්‍රීතු වර්ගය :- ..................................................................................................................
5. ප්‍රමාණය (තොග ලීටර්/කිලෝ ග්‍රෑම්) :-
6. සැර ප්‍රමාණය :-
7. ගමන් මාර්ගය :-
8. වලංගු කාල සීමාව :- .................................................. සිට .................................................. දක්වා
9. වෙනත් කරුණු :-
10. දිනය :-
11. යම් කොන්දේසියක් ඇත්නම්
    ..................................................................................................................
    ..................................................................................................................

ඉහත සඳහන් පානීය නොවන ස්ප්‍රීතු ප්‍රවාහනය සඳහා සුරාබදු කොන්දේසි වලට යටත්ව අවසර දෙමි.

දිනය :- ............................................................

බලයලත් සුරාබදු නිලධාරී

08 - 480

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.